වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

17 JUL 2019

පුනරීක්ෂණ ප්‍රශ්න පත්‍ර - 01

අධ්‍යාපන අමාත්‍යාංශය - වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව Ministry of Education - Commerce Branch

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தரப் பரீட்சை
General Certificate of Education (Adv. Level) Examination

13 ශ්‍රේණිය

| | | |
|---|---|---|
| ව්‍යාපාර අධ්‍යයනය II<br>வணிகக்கல்வி II<br>Business Studies II | 32 S II | පැය තුනයි<br>மூன்று மணித்தியாலங்கள்<br>Three hours |

D.M.C

Learning Resource Center
De Mazenod College
Kandana

එක් කොටසකින් ප්‍රශ්න 2 ක් වත් නියෝජනය වන පරිදි ප්‍රශ්න 05 කට පිළිතුරු ලියන්න

## I කොටස

1. (i) (අ) මිනිස් අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් කිරීම සඳහා ව්‍යාපාර අත්‍යවශ්‍ය වේ. මෙම ප්‍රකාශයට ඔබ එකඟවන්නේ ද? ඔබේ පිළිතුරට හේතු පැහැදිලි කරන්න. (ලකුණු 02)
   (ආ) අවශ්‍යතා හා වුවමනා යන සංකල්ප උදාහරණ මඟින් පැහැදිලි කරන්න. (ලකුණු 02)
   (ii) (අ) සඳුන්ගේ මව රෙදි සෝදන සබන් කැටයක් මිල දී ගත්තාය එය කුමන වර්ගයේ පාරිභෝගික භාණ්ඩයක් ද? එහි විශේෂ ලක්ෂණ මොනවාද? (ලකුණු 02)
   (ආ) චක්‍ර නිෂ්පාදනයක් සමඟ භාණ්ඩ හුවමාරු ක්‍රමය ඇතිවිය. එතැන් සිට අද දක්වා ව්‍යාපාර ක්‍රමිකව විකාශනය වූ ආකාරය පෙළ ගස්වන්න. (ලකුණු 02)
   (iii) (අ) ව්‍යාපාර පරිසරය, ප්‍රධාන සාධක ගැලීම් සටහනක් මඟින් දක්වන්න. (ලකුණු 02)
   (ආ) තාක්ෂණික පරිසරය ව්‍යාපාර කෙරෙහි ඇති කරනු ලබන හිතකර හා අහිතකර බලපෑම් දෙක බැගින් ලියන්න. (ලකුණු 02)
   (iv) (අ) ස්වාභාවික පරිසරයේ රඳා පැවැත්ම කඩවුරු වීමට බලපාන ප්‍රධාන සාධකයකි සමාජ හා සංස්කෘතික පරිසරය. මෙම ප්‍රකාශය උදාහරණ මඟින් පැහැදිලි කරන්න. (ලකුණු 02)
   (ආ) හරිත නිෂ්පාදන ලෙස අදහස් කරන්නේ කුමක්දැයි උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 02)
   (v) (අ) ව්‍යාපාරිකයෙකු වන විශ්ව තම ව්‍යාපාරය සඳහා ව්‍යාපාර ආචාර ධර්ම පද්ධතියක් සකස් කර ගැනීමට අදහස් කරයි. එහි දී සැලකිලිමත් වියයුතු සාධක දෙකක් උදාහරණ සහිතව දක්වන්න. (ලකුණු 02)
   (ආ) ව්‍යාපාරයක සමාජ වගකීම් යනු කුමක්දැයි හඳුන්වා ශිෂ්‍යයෙකු වශයෙන් ඔබගෙන් ඉටු විය යුතු සමාජ වගකීම් දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 02)

2. (i) රජයකට තම ආර්ථික අරමුණු ඉටුකර ගැනීම් සඳහා ව්‍යාපාරවල දායකත්වය අත්‍යාවශ්‍ය වන අතර ව්‍යාපාර වලටද තම අරමුණු ඉටුකර ගැනීමට රජයේ සහයෝගය අත්‍යාවශ්‍ය වේ. ඉහත ප්‍රකාශය උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 04)
   (ii) (අ) ශ්‍රී ලංකා මහ බැංකුව,වාණිජ බැංකු විසින් පවත්වා ගතයුතු ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ඉහළ දැමීමට අපේක්ෂා කරයි. එම තීරණය ව්‍යාපාර කෙරෙහි බලපාන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු02)
   (ආ) පාරිභෝගික ආරක්ෂණය යනු කුමක්දැයි පැහැදිලි කර ශ්‍රී ලංකාවේ ඒ සඳහා ක්‍රියාත්මක වන ආයතන දෙකක් නම් කරන්න. (ලකුණු02)

(iii) (අ) i ව්‍යාපාර සංවිධානයක් යනු කුමක්දැයි හඳුන්වන්න. (ලකුණු01)

ii විධිමත් සංවිධානයක තිබිය යුතු මූලික ලක්ෂණ නම් කරන්න. (ලකුණු01)

(ආ) ව්‍යාපාර සංවිධාන අතර බහුලව දැකිය හැකි වන්නේ තනි ස්වාමි ව්‍යාපාරයයි. එසේ තනි ස්වාමි ව්‍යාපාර බහුල වීමට හේතු මොනවාද? (ලකුණු02)

(iv) (අ) 2007 අංක 07 දරණ සමාගම් පනතට අනුව පිහිටුවිය හැකි සමාගම් වර්ග ගැලීම් සටහනකින් දක්වන්න. (ලකුණු02)

(ආ) සමුපකාර ව්‍යාපාරය ආර්ථික සංවර්ධනයට දායක වන ආකාරය විමසීමක් කරන්න. (ලකුණු02)

(v) (අ) වරලත් ව්‍යාපාර හඳුන්වන්න. (ලකුණු01)

(ආ) වරලත් ව්‍යාපාර වර්ග කර එකිනෙකට උදාහරණ දක්වන්න. (ලකුණු03)

3. (i) (අ) ව්‍යවසායකයෙකු බිහි විය හැක්කේ උප්පත්තියෙන්ම පමණක් නොවේ. ඊට අමතරව ව්‍යවසායක බිහි වීමට පසුබිම් වන හේතු මොනවාද? (ලකුණු 02)

(ආ) සමාජ ආරක්ෂණයෙහිලා සමාජීය ව්‍යවසායකත්වය ඉහළ දායකත්වයක් ලබා දෙයි. මෙම ප්‍රකාශය පිළිබඳව ඔබේ අදහස් දක්වන්න. (ලකුණු 02).

(ii) (ආ) කුඩා ව්‍යාපාරවල සාර්ථකත්වය සඳහා රජයට දායක විය හැකි ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 02)

(ආ) විදේශගතව සිටි මෙරටට පැමිණි සුදේශ් තමා උපයා ගත් මුදලින් කුඩා ව්‍යාපාරයක් ඇරඹීමට අදහස් කරයි. ඒ සඳහා සැලකිල්ලට ගතයුතු කරුණු පිළිබඳව ඔබගෙන් උපදෙස් පතයි. ඔබ විසින් දෙනු ලබන උපදෙස් මොනවාද? (ලකුණු 02)

(iii) හොඳ මුදලක ලක්ෂණ පිළිබඳව ශ්‍රී ලංකාවේ භාවිතා වන ව්‍යවහාර මුදල් ඇසුරෙන් විමසීමක් කරන්න. (ලකුණු 04)

(iv) (අ) ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුණු නම් කරන්න. (ලකුණු 01)

(ආ) ශ්‍රී ලංකා මහ බැංකුව එම අරමුණු සාක්ෂාත් කර ගන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 03)

(v) (අ) චෙක්පතක් ලිවීමේදී සැලකිලිමත් විය යුතු කරුණු මොනවාද? (ලකුණු 02)

(ආ) ණයපත්, හරපත් වැනි විද්‍යුත් කාඩ්පත් මගින් ගනුදෙණු කිරීමට වඩා ව්‍යවහාර මුදල් භාවිතයට ජනතාව පෙළඹී ඇති බව දැකිය හැකිය. ගණුදෙනු කරුවන් විද්‍යුත් මුදල් භාවිතා කිරීමට අකමැත්තක් දක්වන්නේ ඇයි? (ලකුණු 02)

4. (i) අවදානම් ආවරණය කිරීමක් රක්ෂණයෙන් සිදුවේ එසේ නම් ඕනෑම අවදානමක් රක්ෂණය කිරීමට පුද්ගලයෙකුට හෝ ව්‍යාපාරයකට හැකිවේද ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 02)

(ii) මෑත කාලයේ ශ්‍රී ලංකාවේ මහා මාර්ග ප්‍රවාහන පද්ධතියේ කැපී පෙනෙන සංවර්ධනයක් අධිවේගී මාර්ග තැනීම සමඟ සිදු විය. මෙසේ මහා මාර්ග සංවර්ධනය වූ පමණින් රටක ප්‍රවාහනය කාර්යක්ෂම වන්නේ යැයි ඔබ සිතන්නේද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න. (ලකුණු 04)

(iii) වර්තමානයේ ඉලෙක්ට්‍රොනික ඩිජිටල් තාක්ෂණය යටතේ බහුලව යොදාගන්නා සන්නිවේදන ක්‍රම හතරක් නම් කර ඒ එක් එක් ක්‍රම පිළිබඳව කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 04)

(iv) (අ) නාගරබද ප්‍රදේශ වල සුපිරි වෙළෙඳසල් (Super Market) ජනප්‍රිය වීමට හේතු මොනවාදැයි ලියා දක්වන්න. (ලකුණු 04)

(ආ) මෙසේ සුපිරි වෙළෙඳසල් ජනප්‍රිය වුවද සමහර ගනුදෙනු කරුවන් කුඩා සිල්ලර වෙළෙඳසල් වෙත ඇදී යනු දැකිය හැකිය. එසේ වීමට හේතු පැහැදිලි කරන්න

(ලකුණු 02)

(v) වෙළෙඳ ගිවිසුම් හා වෙළෙඳ කලාප ඇති කර ගැනීම වර්තමානයේ දී විදේශ වෙළෙඳාම හා සම්බන්ධ නව ප්‍රවණතාවයකි.

(අ) වෙළෙඳ ගිවිසුම් යනුවෙන් කුමක් අදහස් වන්නේද?

(ආ) ලෝකයේ දැනට ක්‍රියාත්මක වන වෙළෙඳ කලාප දෙකක් නම් කරන්න.

(ඇ) වෙළෙඳ ගිවිසුම් ඇති කර ගැනීම තුළින් රටකට අත්වන වාසි දෙකක් හා අවාසි දෙකක් දක්වන්න (ලකුණු 04)

(මුළු ලකුණු 20)

## II කොටස

5. (i) ව්‍යාපාරයක සාර්ථකත්වයට කළමනාකරණය අත්‍යාවශ්‍ය සාධකයකි මෙම ප්‍රකාශය හේතු දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) කළමණාකරන ක්‍රියාවලිය කාර්යයන් හතරකට බෙදා දැක්වුවද මෙම කාර්යයන් අතර අන්තර් සම්බන්ධතාවක් පවතින බව තහවුරු කරන්න. (ලකුණු 04)

(iii) රොබට් එල් .කර්ට්ස් විසින් කළමණාකරුවන් ප්‍රගුණ කළ යුතු කුසලතා වර්ග තුනක් හඳුන්වා දී ඇත එම කුසලතා වර්ග තුන පැහැදිලි කර, එම කුසලතා විවිධ කළමණාකරන මට්ටම් අතර ඇති සම්බන්ධතාව විමසීමක් කරන්න. (ලකුණු 04)

(iv) මෙහෙයුම් කළමනාකරණ කාර්යයන් අතර පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා වර්තමානයේදී වැදගත් ස්ථානයක් හිමි වී ඇත.

(අ) පර්යේෂණ හා සංවර්ධනය හඳුන්වන්න.

(ආ) නිෂ්පාදන ආයතනයකට පර්යේෂණ හා සංවර්ධන කටයුතු වැදගත් වන්නේ ඇයි? (ලකුණු 04)

(v) (අ) මෙහෙයුම් පිරියත සැලැස්ම යනුවෙන් කුමක් අදහස් වේද?

(ආ) කාර්යක්ෂම නිෂ්පාදන ක්‍රියාවලියක් සඳහා පිරියත සැලැස්ම වැදගත් වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 04) (මුළු ලකුණු 20)

6. (i) (අ) නිමැවුමේ ගුණත්වය යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි පැහැදිලි කරන්න

ආ) නව නිවාස නිර්මාණය කරන Dream house (Pvt) LTD ආයතනය නිවෙස් වල ගුණත්වය ඉහල දැමීමට අපේක්ෂා කරයි. ගුණත්වය ඉහල දැමීමට ඔවුන් විසින් එකතු කල යුතු අංගෝපාංග මොනවාදැයි නම් කරන්න. (ලකුණු 04)

(ii) අලෙවි කළ හැකි අයිතම ලෙස භාණ්ඩ හා සේවා ප්‍රචලිත වුවද ඊට අමතරව අදහස් ද්ගලයන්(persons) ස්ථාන (places)හා සංවිධාන (organizations) ද අලෙවි අයිතම ලෙස හැක්කේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iii) අලෙවිකරණ ප්‍රවර්ධන මිශ්‍රයේ ප්‍රධාන ප්‍රවර්ධන උපකරණ හතරක් නම්කර පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iv) සී/ස ABC සමාගමේ මූලය ප්‍රකාශ වලින් උපුටාගත් කොරතුරු කිහිපයක් පහත දැක්වේ.

| | |
|---|---|
| තොගය | 40 000 |
| බැංකු ණය | 20 000 |
| ණය ගැතියෝ | 20 000 |
| ණය හිමියෝ | 26 000 |
| කලින් ගෙවූ වියදම් | 10 000 |
| අත ඉතිරිය | 30 000 |

| | |
|---|---|
| උපචිත වියදම් | 14 000 |
| ගෙවිය යුතු බදු | 10 000 |
| දළ ලාභය | 100 000 |
| බදු පෙර ශුද්ධ ලාභය | 60 000 |
| විකුණුම් | 400 000 |

ඉහත තොරතුරු පදනම් කරගනිමින් පහත අනුපාත ගණනය කරන්න

(අ) ජංගම අනුපාතය

(ආ) ක්ෂණික අනුපාතය

(ඇ) දළලාභ අනුපාතය

(ඉ) ශුද්ධ ලාභ අනුපාතය (මුළු ලකුණු 20)

7. (i) සීමාසහිත x y පොදු සමාගම පුළුල් කිරීමේ අවශ්‍යතාවයක් පැන නැගී අතර ඒ සඳහා අතිරේක අරමුදල් ලබා ගැනීමට අපේක්ෂා කෙරේ. මෙම සමාගමේ ලාභදායකත්වය ඉහල මට්ටමක පවතින අතර දැනට පවතින්නේ අවතෝලන ප්‍රාග්ධන ව්‍යුහයකි. සමාගමට අවශ්‍ය අතිරේක අරමුදල් ලබා ගැනීම සඳහා ණයකර නිකුත් කරනවාද? නොඑසේ නම් සාමාන්‍ය කොටස් නිකුත් කරනවාද ? යන්න තීරණය කිරීමට අවශ්‍ය වී ඇත. සමාගමේ දැනට පවතින තත්ත්වය යටතේ ඉහත කී මූල්‍ය සම්පාදන මාර්ග දෙක අතුරින් වඩාත් යෝග්‍ය වන්නේ කුමක්ද? ඔබේ පිළිතුරට හේතු පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) සීමාසහිත පොදු සමාගමක මූල්‍ය සම්පාදන මාර්ග ලැයිස්තුවක් පහත දැක්වේ.

| | |
|---|---|
| 1. සාමාන්‍ය කොටස් | 6. කල් බදු |
| 2. රඳවාගත් ලාභ | 7. වාණිජ පත්‍රිකා |
| 3. බැංකු ණය | 8. වත්කම් විකිණීම |
| 4. සමුච්චිත ක්ෂයවෙන් කිරීම | 9. බැංකු අයිරා |
| 5. වරණීය කොටස් | 10. සංගමිත ණයකර |

ඉහත මූල්‍ය සම්පාදන මාර්ග පහත ශීර්ෂ යටතේ වෙන් වෙන්ව ලියා දක්වන්න

(අ) සෘජු මූල්‍ය මාර්ග

(ආ) වක්‍ර මූල්‍ය මාර්ග

(ඇ) අභ්‍යන්තර මූල්‍ය මාර්ග

(ඉ) බාහිර මූල්‍ය මාර්ග (ලකුණු 04)

(iii) (අ) රැකියා අයදුම් පත්‍රයක /ජීව දත්ත විස්තරයක සාමාන්‍යයෙන් ඇතුලත් කරනු ලබන කරුණු මොනවාද?

(ආ) රැකියාවක් සඳහා යෝග්‍ය අයදුම්කරුවන් තෝරා ගැනීමේ ක්‍රමයක් වශයෙන් අයදුම්පත/ජීව දත්ත විස්තරය ප්‍රයෝජනවත් උපකරණයක් ලෙස සැලකෙන්නේ කුමන හේතු නිසාදැයි පැහැදිලි කරන්න (ලකුණු 04)

(iv) (අ) පුහුණුව හා සංවර්ධනය අතර ඔබ දකින වෙනස්කම් මොනවාද?

(ආ) පුහුණුව හා සංවර්ධනය තුළින් සේවායෝජකයාට හා සේවකයාට අත්වන ප්‍රතිලාභ දෙක බැගින් වෙන වෙනම ලියා දක්වන්න. (ලකුණු 04)

(v) (අ) රැකියා විශ්ලේෂණය යනු කුමක්දැයි පැහැදිලි කරන්න.

(ආ) රැකියා විශ්ලේෂණයෙන් ලබා ගන්නා තොරතුරු මත පිළියෙල කරනු ලබන රැකියා විස්තරය හා රැකියා පිරිවිතරය අතර සැසඳීමක් කරන්න. (ලකුණු 04)

(මුළු ලකුණු 20)

